**නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම - 2019**
**-----------------------------------------------**

## 1.1 මතය
**------**

නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**විශේෂිත කරුණු**
**-------------------**

තත්ත්වාගණනය නොකළ මාගේ මතයට අමතරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.2 වෙත අවධානය යොමු කරවමි. ඉහත සටහනේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය මෙහෙයවනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් සමාගමේ කටයුතු මෙහෙය වීම හා පාලනය සිදු කරනු ලැබේ.

2018 අගෝස්තු 28 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඈවර කිරීම සහ සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙනත් ආයෝජකයෙකු වෙත විකිණීම, මහ බැංකුවේ අනුමැතියට යටත්ව සිදු කල යුතු බව තීරණය කර තිබුණි.

කෙසේ වුවත් 2020 පෙබරවාරි 26 නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් ඉහත දැක්වූ අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කර තිබුණි. එහි නැට්වෙල්ත් සෙකියුරිටීස් සීමිත සමාගමේ නව කොටස් වලින් සියයට 49ක් පමණක් විකිණීමට සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වන තෙක් නැට්වෙල්ත් කෝපරේෂන් සමාගමේ ඈවර කිරීම අත්හිටුවන ලෙසද දක්වා තිබුණි.

තවද 2019 මැයි 21 දින සිට 2019 නොවැම්බර් 30 දිනට බලපාන පරිදි මාස 06ක කාලයකට ප්‍රාථමික ගනුදෙනු කටයුතු සහ ව්‍යාපාර කටයුතු සිදු කිරීම නැට්වෙල්ත් සෙකියුරිටීස් සීමිත සමාගමට ඇති අවසරය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් අත්හිටුවන ලදී. 2020 ජුනි 01 දින සිට නැවතත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නැට්වෙල්ත් සිකියුරිටීස් සීමිත සමාගමේ ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කිරීම මාස 6කට අත්හිටුවා ඇත.

## 1.2 මතය සඳහා පදනම
**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ
  එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| අධිකාරී බලය නොලත් ගණුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ අරමුදල් කළමනාකරණ ගිවිසුමේ අවශ්‍යතාවයට පටහැනිව සමාගමේ හිටපු ප්‍රධාන විධායක අධ්‍යක්ෂ හා හිටපු ප්‍රධාන ගණුදෙනුකරු, ට්‍රිලියන් සිකියුරිටීස් පුද්ගලික සමාගම හා වර්චුවල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ට්‍රේඩින් ලංකා පුද්ගලික සමාගම නම් වූ පුද්ගලික සමාගම් 02 ක් සමඟ අවධිමත් ගණුදෙනු සිදුකිරීමට සම්බන්ධවී තිබුණි. මේ සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීම සමාගමේ ආයෝජන කමිටුව විසින් සිදු කල යුතු වුවත් ඉහත නිලධාරීන් දෙදෙනා සමාගමේ අනුමැතියකින් තොරව ආයෝජන තීරණ ගෙන තිබුණි. | ගැටලුකාරී පොලිය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය සිදුකල වංචනික ගණුදෙනු සඳහා ක්‍රියාකිරීමට NWSL සමාගමට බලයක් නොමැති බව අපගේ අදහස වේ. | සියළුම ආයෝජන තීරණ ආයෝජන කමිටුව විසින් ගතයුතු බව නිර්දේශ කරනු ලැබේ. |
| (ආ) දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11 (2), 2009 ජුනි 24 දිනැති රීති අංක 01/2009 හා ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11 (2), 2009 ජුනි 24 දිනැති රීති අංක 01/2009 අනුව හිමිවන බලය යටතේ ඉහත සේවායෝජකයන් දෙදෙනා සමග වූ ප්‍රධාන ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුමට අනුව, ප්‍රතිමිලදී ගැණුම් ගණුදෙනු තුළින් ඇතිවන සියලු ගාස්තු උක්ත සේවායෝජකයන් දෙදෙනාට නියමිත පරිදි ගෙවීමට උපදෙස් දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 අගෝස්තු 07 දින සමාගමට නියෝගයක් නිකුත් කර තිබුණි. CBSL විසින් මෙම නියෝගය අවලංගු කර නොතිබුණු හෙයින් සමාගම ඒ අනුව කටයුතු කිරීමට වගකීමට බැඳේ. | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් සේවායෝජකයන් දෙදෙනාට උපදෙස් දෙමින් 2015 අගෝස්තු 07 දින නියෝග නිකුත් කර තිබුණි. 2016 ජූලි 29 දින ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව වෙත අවධානය යොමු කරවමි. කෙසේ වුව ද NWSL සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට පෙර 12 වන වගන්තියේ රෙගුලාසි යටතේ අවස්ථාවක් ලබා දීමට තිබුණි. ජනාධිපති නීති සභාවේ උපදේශක රොනල්ට් පෙරේරා මහතාගේ වෘත්තීමය අදහස් ඔබ දෙපාර්තමේන්තුව වෙත 2017 ඔක්තෝම්බර් 25 දිනැති ලිපියෙන් දන්වන ලදී. තවද 2016 ජූලි 29 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සහ 2016 දෙසැම්බර් 27 දින ලැබුණු ව්‍යවහාරික විගණන වාර්තාව සම්බන්ධයෙන් නියෝග හෝ නීතිමය උපදෙස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී නොතිබුණි. තවද ට්‍රිලියන් සෙකියුරිටීස් සීමිත | ශ්‍රී ලංකා මහබැංකුව මේ සම්බන්ධයෙන් කඩිනමින් නියෝග දියයුතු බව නිර්දේශ කරමි. |
| (ඇ) CBSL විසින් කරන ලද මෙම නියෝගයට එරෙහිව සමාගම විසින් 2015 අගෝස්තු 18 දින අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනුකර තිබුණු අතර 2015 සැප්තැම්බර් 04 දින දක්වා එම නියෝගය ක්‍රියාත්මක නොකරන ලෙස ප්‍රකාශ කරමින් අභියාචනාධිකරණය විසින් | | සමාගම විසින් මෙම මුදල සහ පොළිය පියවීම වෙනුවෙන් වෙන් කිරීමක් ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කල යුතු බවට නිර්දේශ කරමි. |

| | | |
|---|---|---|
| අතුරු නියෝගයක් නිකුත් කර තිබුණි. එසේ වුවද වගඋත්තර පාර්ශවකරුවන් සියලු දෙනා විසින් කරන ලද ඉල්ලීම සලකා බලා 2016 මාර්තු 29 දින උක්ත අතුරු නියෝගය අභියාචනාධිකරණය විසින් ඉල්ලා අස් කරගෙන තිබුණි. පසුව, අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීන්දුව අභියෝගයට ලක්කරමින් 2016 අප්‍රේල් 18 දින සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් අභියාචනයක් කර තිබුණි. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාගමට පක්ෂපාතීව කිසිදු තීරණයක් ලබාදී නොතිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 27 දින ව්‍යවහාරික විගණන වාර්තාව සමාගම විසින් CBSL වෙත ලබාදී තිබුණි. කෙසේ වුවත් ට්‍රිලියන් සෙකියුරිටීස් පුද්ගලික සමාගම විසින් සමාගමට එරෙහිව නඩුවක් ගොනුකර තිබූ අතර 2018 නොවැම්බර් 02 දින එම නඩුවේ විනිශ්චය ලබා දෙන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චය අනුව සමාගම ට්‍රිලියන් සෙකියුරිටීස් පුද්ගලික සමාගමට රු. 53,830,745ක මුදලක් හා 2014 ජූලි 25 දින සිට සියයට 14ක පොලියක්ද රු. 72,519 සඳහා වාර්ෂිකව සියයට 14 පොලියක් 2014 ජූලි 31 සිට ගෙවියු යුතු විය | සමාගම විසින් ගොනුකර තිබූ නඩුවට අදාල විනිශ්චය 2018 නොවැම්බර් 02 දින සමාගම වෙත ලැබී තිබුණි නමුත් මහ අධිකරණය විසින් සමාගම කෙරෙහි අනුග්‍රහයක් දක්වා නොතිබුණි. එම නිසා සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් 2018 නොවැම්බර් 16 දින ඉදිරිපත් කරන ලදී. | |
| (ඇ) 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගම් 02 කට (වයිට් ග්‍රෝව් හෝල්ඩින්ග්ස් හා ඇස්ට්‍රල් කැපිටල් හෝල්ඩින්ග්ස්) ගෙවන ලද රු.19,725,000 ක් වූ අවිධිමත් තැරැව් ගාස්තු සම්බන්ධයෙන් සමාගම විසින් 2016 වර්ෂයේදී අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. මෙම සමාගම් මූල්‍ය සමාගම් ලෙස CBSL යටතේ ලියාපදිංචි වී තිබේද යන්න පිළිබඳ ගෙවීම කිරීමට පෙර සමාගම විසින් සනාථ කරගෙන නොතිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. | | කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු බව නිර්දේශ කරමි. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1 වගන්තිය | හැකියාව ඇගයීම හා උපරිම ඵලදායීතාවය ලබා ගැනීම සඳහා සමාගමේ අනුමත සේවක සංඛ්‍යාවක් | ඒකාබද්ධ සමාගම්වල අනුමත කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර මහපොළ උසස් | සමාගම මෙම රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

| | |
|---|---|
| සිටිය යුතු නමුත් NWCL හි 2019 වර්ෂයේ සිටිය යුතු සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකාර මණ්ඩලයෙන් අනුමත කරගෙන නොතිබුණි. | අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල වෙත ඉදිරිපත් කර ඇත. එම අනුමැතිය අපේක්ෂාවෙන් සිටිමු. |

## 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (අ) මෙම සමාගම සඳහා තක්සේරු වර්ෂ 2008/2009, 2009/2010, 2010/2011, 2011/2012, 2013/2014, 2014/2015 සහ 2015/2016 සඳහා පිළිවෙළින් රු.24,136,857 රු.77,382,317 රු.84,378,708, රු.66,181,759, රු.18,288,933, රු.113,687,212 හා රු.36,466,487 ක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් බදු තක්සේරු ලැබී තිබුණි. තවද, ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එයට 50%ක දඩයක් පනවා තිබුණි. සමාගම විසින් ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද එම තක්සේරුවලට එරෙහිව අභියාචනයක් ඉදිරිපත්කර තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තු පනතේ දෙවන ප්‍රතිපාදන 32(1) වගන්තිය අනුව ප්‍රාථමික වෙළඳපලේ සමහර රජයේ සුරකුම්පත් ගණුදෙණුවලට බදු අය නොකෙරේ. අදාළ ව්‍යවස්ථාපිත පොලී ආදායම් ගණනයකිරීම් ක්‍රියාවලියේ දී එය සැලකිල්ලට ගෙන නොතිබුණි. එම නිසා මෙම බදු තක්සේරු නිකුත් කිරීමේ දී මෙම විශේෂිත ප්‍රතිපාදන නොසලකා හැර තිබේ. | බදු ගැටළුව විසඳීම සඳහා සමාගම විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දක්වා ඇති පරිදි කටයුතු කල යුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී බදු තත්ත්වය පිළිබඳ සුදුසු ගැලපීම් කිරීම සඳහා බදු උපදේශකයකුගෙන් උපදෙස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගත යුතුය. |
| (ආ) මූල්‍ය සේවාවන් සඳහා එකතු කල අගය මත බදු තක්සේරු 2013 වර්ෂය සඳහා වටිනාකම රු.16,600,601 සහ 2014 වර්ෂය සඳහා වටිනාකම රු.58,097,943 ක් ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද උක්ත තක්සෙරුවලට එරෙහිව සමාගම විසින් අභියාචනයක් සිදු කර තිබුණි. ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉහත අගය මත 50%ක දඩ මුදලක් පනවා තිබුණි. | 25(A) වගන්තිය යටතේ සමාගම වැටි නොගෙවයි. සමාගම මූල්‍ය සේවා සපයන ව්‍යාපාරයක් නොවන බව කළමනාකරණයේ අදහස වේ. | සමාගම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ නියමය ක්‍රියාත්මක කර බදු නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.224,420,525 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 243,412,073 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.467,832,598ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන වියදම් රු. 284,376,048 කින් අඩුවීම සහ රු.319,772,260 ක සුරකුම් පත් ප්‍රතිමිලදී ගැනීමේ ලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචන වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමහ සසඳා විශ්ලේෂණය කර පහත දැක්වේ.

(අ) 2019 වර්ෂයේ රු.119,096,047 ක් වූ ආයෝජන වියදම් ඉකුත් වර්ෂයේ ආයෝජන වියදම වූ රු.403,472,095 සමහ සැසැඳීමේ දී සමාගමේ සංයෝජන වියදම සියයට 70ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) 2018 වර්ෂයේ සුරකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්දී (ලාභය) රු.152,014,625 ක් වූ අතර ඉකුත් වර්ෂයේ සුරකුම්පත් ප්‍රතිමිලදී ගැනීම් වූ (පාඩුව) රු.167,757,635 සමහ සැසැඳීමේ දී සියයට 190 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| සමාගම ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ව්‍යාපාරික කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටුවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් කොන්දේසි සහිත මාස 06 සඳහා අවලංගු කිරීමට තීරණය කර ඇත. මෙහිදි සමාගමේ අයිතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම අවසන් කරන තෙක් සහ මාසිකව සමාගමේ වර්ධනය පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් වන තෙක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය අවසන් කිරීමට අවස්ථාව නොමැත. තවද සමාගම විසින් විමර්ශණ හා අධික්ෂණ කටයුතු සිදු කිරීමේ දී ප්‍රාථමික හා ද්විතික වෙළඳපොළේ රජයේ සුරකුම්පත් හා ප්‍රතිමිලදී ගැනීමේ | රටේ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම ඉදිරියට කරගෙන යෑමට සමාගම් වලට නොහැකි වීමෙන් කොන්දේසි ප්‍රකාරව ක්‍රියා කිරීමට නොහැකි විය.තවද නව කැබිනට් තීරණ ලබා ගැනීම සඳහා උසස් අධ්‍යාපන තාක්ෂණික හා වන උත්පාදන අමාත්‍යාංශය සම්බන්ධ කර ගැනීමට නොහැකිවීමද උක්ත කරුණට බලපා ඇත. තවද සියළුම ආයතන වල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය තනතුරු වලින් අස්වන ලෙස සභාපති විසින් සියළුම අමාත්‍යාංශ භාර ලේකම්වරුන් වෙත දන්වා ඇති බැවින් සමාගමේ සභාපති සහ එක් අධ්‍යක්ෂවරයකු අස්වී ඇත. සමාගමේ කටයුතු තාවකාලිකව | සමාගම විසින් අයිතිය පිළිබඳ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීම සහ ප්‍රාථමික, ද්විතීක වෙළඳපල සහභාගීත්වය වැඩි කිරීමට සුදුසු පියවර ගත යුතු බවට නිර්දේශ කරමි. |

| | | |
|---|---|---|
| ගනුදෙනු වලට ඵලදායීව සහභාගී වීම සිදුකළ යුතු අතර සියළු අවස්ථා වල සමාගම අදාළ නීතිරීති හා රෙගුලාසි මාර්ගෝපදේශ වලට එකඟ විය යුතුය. කෙසේ වෙතත් එම කොන්දේසි වලට අනුකූල වීමට සමාගම අපොහොසත් වීම නිසා ප්‍රාථමික ගනුදෙනු කරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු සිදු කිරීම නැවත මාස 06ක කාලයකට අත්හිටුවන ලදී. | අත්හිටුවීම අහෝසි කිරීමෙන් පසුව ප්‍රථමික හා ද්විතික වෙළඳපල ගනුදෙනු සහ සමාගමේ කාර්යයන් සඳහා සහභාගී වීම සැලකිය යුතු මට්ටමකින් පහල වැටී ඇත. | |

**4. ගිණුම් කටයුතුභාවය හා සැලැස්ම**

**4.1 සංයුක්ත සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|
| 2018 – 2020 දක්වා කාලයට ආයතනය විසින් උපාය මාර්ග ව්‍යාපාර සැලැස්ම පිළියෙළ කර ඇතත් වෙළඳපල තත්ත්වයන් පදනම් කරගත් සංශෝධිත උපායමාර්ග ව්‍යාපාර සැලැස්මක් 2019 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. | 2018 සිට 2020 දක්වා කාලයට උපාය මාර්ග ව්‍යාපාර සැලැස්ම පිළියෙළ කරන ලද්දේ 2017 පැවති වෙළඳපළ තත්ත්වයන් හා අනාගත පුරෝකථනයන් පදනම් කරගෙනය. කෙසේ වුවත් සමාගම මුහුණ දෙන ගැටළු සැලකිල්ලට ගනිමින් 2019 වර්ෂය සඳහා 2018 දෙසැම්බර් 14 දින නව අයවැයක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සමාගම වෙළඳපල තත්ත්වයන් සලකා සංශෝධිත උපායමාර්ග ව්‍යාපාර සැලැස්ම පිළියෙල කල යුතුය. |